## ජාතික විද්‍යා පදනම

01. මූල්‍ය ප්‍රකාශන

1:1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට ජාතික විද්‍යා පදනමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 ට අනුව වර්ෂයක සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරීන් වෙනුවෙන්ද පාරිතෝෂික වෙන් කිරීම සිදු කළ යුතු වුවද, ප්‍රවර්තන වර්ෂයේ පාරිතෝෂික වෙන් කිරීමේදී ඒ පිළිබඳ නොසලකා තිබුණි.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පර්යේෂණ ව්‍යාපෘතියක් සඳහා 1984 වර්ෂයේදී පේරාදෙනිය විශ්ව විද්‍යාලයට ලබාදෙන ලද රු.42,250 ක් වටිනා ට්‍රැක්ටරය විශ්ව විද්‍යාලයට පැවරීමට හෝ ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

ආසියා ශාන්තිකර ජාලය (APN) ව්‍යාපෘතිය සඳහා ලැබුණු ඇ.ඩො.52,000 න් ඇ.ඩො.41,562 ක් ආපසු යවා තිබූ අතර 2005 වර්ෂයේදී දකුණු හා ගිණිකොන දිග ආසියාවේ ගංගා ද්‍රෝණි පිළිබඳ වැඩමුළුව සඳහා LOICZ වෙතින් ලැබුණු මුදලින් නිරවුල් නොකළ ශේෂය රු.1,501,109 ක් විය.

### 1.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| විෂයය | වටිනාකම | නොසැපයූ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ඉඩම් | 370,000,000 | ඉඩමේ හිමිකම් ඔප්පුව. |
| ස්ථාවර වත්කම් (ගොඩනැගිලි හැර) | 96,938,423 | වටිනාකම දැක්වෙන උපලේඛන. |
| තොග | 4,096,309 | භෞතික තොග සමීක්ෂණ වාර්තා |
| ණයහිමියන් | 2,832,588 | අදාල පාර්ශ්වයන් විසින් ශේෂ සනාථ කිරීම් |
| ආයෝජන | 112,000,000 | කොටස් සහතික |

### 1.2.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකුල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකුල නොවීම |
|---|---|---|
| (අ) | 1985 අංක 01 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත හා 1988 අංක 47 දරන සේවානියුක්තිකයන්ගේ භාර අරමුදල් පනත | විද්‍යා පදනමේ සේවකයින් 91 දෙනෙකු සඳහා සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක මුදල් ගණනය කිරීමේදී ජීවන වියදම් දීමනා ඇතුළත් වැටුප සැලකිල්ලට ගත යුතු වුවත්, මූලික වැටුපට පමණක් දායක මුදල් ගණනය කර තිබුණි. |
| (ආ) | 2003 ජූනි 02 දිනැති හා අංක පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.10 ඡේදය | කොන්ත්‍රාත් පදනමින් හෝ අනියම් පදනමින් සේවකයන් බඳවා ගැනීමේදී භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු වුවත්, අනුමැතිය ලබා ගැනීමේදී සිදුවූ ප්‍රමාදයන් හේතුකොටගෙන අනුමැතියකින් තොරව වර්ෂ ගණනාවක සිට කාර්යය පැවරුම් පදනම මත බඳවා ගැනීම් කර තිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන චක්‍රලේඛයේ 3.4 ජේදය හා ප්‍රසම්පාදන අත්පොතේ 2.14 ජේදය | ආයතනයේ ආරක්ෂක සේවා සැපයීම සම්බන්ධයෙන් අවම වශයෙන් ආයතන 05 කින්වත් මිල ගණන් කැඳවිය යුතු වුවද, එසේ සිදු කර නොතිබුණි. |
| (ඈ) | මු.රෙ. 102, 103 | අංක 253-7182 දරන වාහන අනතුර සම්බන්ධයෙන් මු.රෙ.ප්‍රකාර විමර්ශන කටයුතු කර නොතිබුණ අතර, රක්ෂණ වන්දියෙන් ආවරණය නොවුණු රු.80,464 අලාභයට සම්බන්ධ වගකිවයුත්තන් තීරණය කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පදනමේ වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.4,658,685 ක ඌනතාවයක් වූ අතර, ඉකුත් වර්ෂය සඳහා ඊට එරෙහි අතිරික්තය රු.4,721,202 ක් විය. මේ අනුව, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල වලරු.9,379,887 ක අඩුවීමක් දක්නට ලැබුණි. මෙයට බලපෑ ප්‍රධාන හේතු වූයේ පෞද්ගලික පඩිනඩි රු. මිලියන 5.677 කින්ද අනිකුත් වියදම් රු. මිලියන 3.241 කින්ද වැඩිවීම හා ආදායම රු. මිලියන 0.576 කින් අඩුවීමත් ය.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශ අනුව මූල්‍ය ප්‍රතිඵලවල අදියරයන් ඉකුත් වසර හා සසඳා පහත දැක්වේ.

| අයිතමය | 2011<br>රු. | 2010<br>රු. | පූර්ව වර්ෂය සමඟ වෙනස් වීමේ ප්‍රතිශතය<br>% |
|---|---|---|---|
| රජයේ ප්‍රදාන | 68,951,000 | 60,976,000 | 13 |
| වෙනත් ආදායම් | 8,231,000 | 16,782,000 | 51 |
| බඳුහැර මුළු පුනරාවර්තන වියදම | 81,840,550 | 73,037,239 | 12 |

| | | | |
|---|---|---|---|
| මෙහෙයුම් කටයුතුවලින් අතිරික්තය / (ඌනතාවය) | (4,658,685) | 4,721,203 | 198 |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ). 2011 අප්‍රේල් 20 දින කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් කාර්ය මණ්ඩල අනුමත කිරීම සිදු කර තිබුණද, පුරප්පාඩු 47 ක් සමාලෝචිත වර්ෂය අවසානය තෙක් පුරවා නොතිබුණි.

(ආ). මානව සම්පත් සංවර්ධන නිලධාරි තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම්කරුවෙකු 2011 අගෝස්තු මස 26 දින තෝරාගෙන ඇතත්, 2012 මැයි 31 වනවිටත් පත්වීම් ලබාදී නොතිබුණි.

(ඇ). රු.2,810,000 ක් වටිනා DVD හා VCD 25,200 ක් 2008 වර්ෂයේ සිට ගබඩාවේ නිෂ්ක්‍රීයව තිබූ අතර, මෙම තොගයෙන් විශාල ප්‍රමාණයක් නොවිකිණී තිබුණි. ඇතැම් DVD හා VCD ක්‍රියාවිරහිතව තිබූ අතර, රු.1,744,000 ක් වටිනා තොග 2009 හා 2010 වර්ෂවලදී නොමිලේ බෙදා දී තිබුණි. 2011 දෙසැම්බර් වනවිට රු.47,300 ක් වටිනා අක්‍රිය වූ තොග ගබඩාවේ පැවතුණි.

3.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

(අ) ප්‍රකාශන ගබඩාව පරීක්ෂාවේදී නිකුත් වන ප්‍රමාණය සැලකිල්ලට නොගෙන ප්‍රකාශන මුද්‍රණය කර ඇති බව නිරීක්ෂණය විය. රු.3,132,907 ක් වටිනා පොත් 7698 ක් දිගු කලක සිට ගබඩාවේ නිෂ්ක්‍රීයව පවතී.

(ආ) 2010 හා 2011 වර්ෂ වලදී මුද්‍රිත J.NSF ජ'නල්, විකුණා හෝ නොමිලේ නිකුත් කර තිබුණේ සීමිත පිටපත් සංඛ්‍යාවක් වූ අතර, මුද්‍රිත ප්‍රමාණයෙන් 50% කට වඩා වැඩි ප්‍රමාණයක් නොවිකිණී ඉතිරි වී තිබුණි.

(ඇ) විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත රු.68,380 ක් වටිනා ප්‍රකාශන තොගයක් පොත් සාප්පුවලට යවා තබූ අතර, ඇතැම් පොත් භාර දී අවුරුදු 09 කට අධික කාලයක් ගත වී ඇතත්, මුදල් ලබා ගැනීමට හෝ පොත් ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.3 ආර්ථික නොවූ ගනුදෙනු

----------------------------

උපදේශකවරුන් බඳවා ගැනීම

----------------------------------

විද්‍යා පදනම විසින් විශේෂඥ උපදේශකයින් තිදෙනෙකුගේ සේවය ලබාගෙන තිබූ අතර, සමාලෝචිත වර්ෂයේදී ඒ වෙනුවනේ රු.1,201,408 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ජාතික විද්‍යා පදනමට විද්‍යා මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමේ අරමුණින් 2006 අගෝස්තු 01 දින සිට උපදේශිකාවක් බඳවාගෙන තිබුණද, පත්වීමේ දින සිට වර්ෂ 5 ක් ගතවීත් අදාල කාර්යය ඉටු කර නොතිබුණි.

(ii) ගිණුම් හා පරිපාලන කටයුතු සඳහා පත් කර ඇති උපදේශිකාව සඳහා මාසිකව රු.60,000 ක් ගෙවා තිබූ අතර, 2009 මාර්තු මස සිට 2011 දෙසැම්බර් 31 දක්වා අඛණ්ඩව සේවයේ යොදවාගෙන තිබුණි. ඉදිරිපත් කර තිබූ ඉදිරි වැඩසටහන් ඒකාකාර ස්වරූපයක් ගෙන තිබුණ බවද, පරිපාලන අංශයේ හා ගිණුම් අංශයේ කටයුතු වැඩි දියුණු කිරීම සඳහා උපදේශකත්වයක් ලබා දී ඇති බවට සාක්ෂි නොතිබූ බවද නිරීක්ෂණය විය.

(iii) විද්‍යාව ප්‍රචලිත කිරීමේ අංශය භාරව සිටි නිලධාරිනිය විශ්‍රාම ගැනීමෙන් අනතුරුව විද්‍යා පදනමේ උපදේශිකාවක ලෙස පත් කර තිබුණි.

3.4 හඳුනාගත් පාඩු

-------------------

2010 හා 2011 වර්ෂවල අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත ප්‍රකාශන ගබඩාව තුළ වූ ජ'නල් හා සඟරා මාස 06 කට වඩා පැරණි ඒවා 50% කින්ද වසර 01 කට වඩා පැරණි ඒවා 100% කින්ද, මුද්‍රණය කර අවුරුදු 05 කට වඩා පැරණි පොත් අගය ශුන්‍ය වූ රු.1,301,163 ක් වටිනා පොත්ද ගිණුම් වලින් කපාහැර තිබුණි. පෙර වර්ෂයේදී කපාහල ප්‍රමාණය රු.1,306,824 ක් ද විය.

3.5 ප්‍රමාද වූ ව්‍යාපෘති

--------------------

විද්‍යා පදනමේ කටයුතු පරිගණක ගත කිරීම සඳහා 2011 පෙබරවාරි 15 දින කොළඹ විශ්ව විද්‍යාලය සමඟ රු.2,999,000 ක ගිවිසුමකට ඇතුලත් වී තිබූ අතර රු.599,800 ක් ගෙවා තිබුණි. 2012 මැයි 31 දින වනවිට නිමකර තිබුණේ 10% ක ප්‍රමාණයක් පමණි.

3.6 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් මණ්ඩලයේ සම්පත්

(අ) ජාතික යොවුන් සේනාංකයෙන් තාවකාලිකව අනුයුක්ත කළ නිලධාරිනියක් හා පළාත් ගුරු සේවයෙන් මුදා හරින ලද නිලධාරියෙක් තාවකාලිකව අනුයුක්ත කර නැවත තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයට මුදා හැර තිබූ අතර, එම නලධාරින්ගේ වැටුප් වශයෙන් පිළිවෙලින් රු.156,501 ක් හා රු.203,971 ක් ගෙවා තිබුණි.

(ආ) අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පැවතිය ද විද්‍යා පදනමේ යතුරු ලේඛිකාවක් තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය වෙත මුදා හැර තිබුණි.

4. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරේ විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

(අ) පර්යේෂණ ප්‍රදාන
(ආ) බඳවා ගැනීම්
(ඇ) ප්‍රකාශන තොග